# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

2014 මැයි




අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය විසින් සංවිධානය කළ විරෝධතා ව්‍යාපාරය. මැයි 16 වන දින පැවැත්වූ මෙම විරෝධතාවයේ දී සාමකාමී ශිෂ්‍ය විරෝධතාකරුවන් 17ක් පොලීසිය විසින් රඳවා තබා ගනු ලැබූ අතර කිහිප දෙනෙකුට වදහිංසා පමුණුවන ලදී. (ඡායාරූපය - ලංකා යුනිවසිටි නිවුස් )

**INFORM**
Human Rights Documentation Centre
informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

A. විරෝධතාවයක් සංවිධානය කිරීම හේතුවෙන් මානව හිමිකම් ක්‍රියාධරයෙක් / දේශපාලන පක්ෂ ක්‍රියාකරුවෙකු අත්අඩංගුවට ගැනීම

B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම්

C. සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම්

D. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය කිරීම

E. දමිළ ප්‍රජාව විසින් සංවිධානය කළ සිහිපත් කිරීම් මර්දනය කිරීම

ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙහි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත්වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙළෙසීමට ලක්වන අනෙක් ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය, මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

## සාරාංශය:


මැයි පළමු දා (ලෝක කම්කරු දිනය), මැයි 3 වැනි දා (ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය) සහ මැයි 18 (යුද්ධය අවසන් කර වසර 5ක් ගත වීම සනිටුහන් කළ දිනය) යන දිනයන් ශ්‍රී ලාංකීය සමාජය තුළ පවත්නා බෙදීම් සහ ඒකාධිපතිවාදී රජය මගින් සිදු කෙරෙන මර්දනයන් විද්‍යාමාන කළ සුවිශේෂී දින තුනක් විය. වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින එක්සත් පෙරමුණක් වෙනුවට ජනතාව රජයට හිතවාදී සහ රජයට විරුද්ධ කණ්ඩායම් වශයෙන් බෙදී සිටින බව මැයි දින රැළි තුළින් පිළිඹිබු විය. රජය පිළිබඳ විවේචනාත්මක අදහස් ප්‍රකාශ කරන වෘත්තීය සමිති සංධානය (**Trade Union Alliance**) විසින් කොළඹ දී පැවැත් වූ සිය මැයි දින රැලියට පොලීසිය විසින් බාධා එල්ල කළ බවට පැමිණිලි කරන ලදී. පසුව වැඩ වර්ජනය කළ සේවකයන්ට පහර දෙන ලදී. ලෝක ජනමාධ්‍ය නිදහස පිළිබඳ දිනය වෙනුවෙන් ජනමාධ්‍ය කණ්ඩායම් විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිය වෙනුවෙන් දැවැන්ත ව්‍යාපාරයක් ද ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ ජනමාධ්‍ය නිදහස යනුවෙන් මහජන දේශනයක්ද සංවිධානය කරන ලදී. කෙසේ වුවද රජය ලෝක ජනමාධ්‍ය නිදහස පිළිබඳ දිනය නොසලකා හැර තිබූ බව පෙනෙන්නට තිබුණි. ශ්‍රී ලාංකික සමාජය තුළ පවතින ගැඹුරු ධ්‍රැවීයකරණය මැයි 18 වන දින පැවති උත්සව සහ වැඩසටහන්වල දී මතු වී පෙනුනි. රජයේ 'යුද විජයග්‍රහණ සැමරුම'ට සහභාගි වූවන් බහුතරයක් සිංහල වූ අතර බහුතරයක් දමිළ ජනතාව විශේෂයෙන්ම උතුරේ වෙසෙන දමිළ ජනතාව මියගිය අය, අතුරුදහන් වූවන් සහ යුද්ධය සම්බන්ධ ඔවුන් ගේ දුක්ඛදායක අත්දැකීම් සිහි කරමින් මේ දිනය සංවේගශීලීව ගත කළහ.

තරුණ ප්‍රජාව එකිනෙකට ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් දෙකක් ලෙස ඉදිරියට ආ මාසයක් ලෙස මැයි මාසය සැලකිය හැකිය. සිය නිදහස් සහ ගුණාත්මක අධ්‍යාපනය සඳහා ඇති අයිතිය වෙනුවෙන් සටන් කරන ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට සිය විරෝධතාවය නවත්වන ලෙස බිය ගන්වනු ලැබූ අතර ශිෂ්‍යයින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇතැමුන්ට වද හිංසා ද පමුණුවන ලදී. ඒ අතරම ශ්‍රී ලංකා රජය විසින් රටවල් සිය ගණනක් සහභාගි වූ ලෝක තරුණ සමුළුව කොළඹදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය අරගලය, යුද්ධයේ බලපෑම සහ මානව හිමිකම් තත්වය , නීතියේ ආධිපත්‍යය යනාදිය පිළිබඳ දැන ගැනීමට අවස්ථාවක් ලෝක තරුණ සමුළුව තුළ නොපැවති බව ද සමුළුවට සහභාගී වූ නියෝජිතයන් කිහිප දෙනෙකු විසින් වගවීම පිළිබඳ රජයෙන් අසන ලද ප්‍රශ්න මුළුමණින්ම නොසලකා හැරි බව ද සමුළුවට සහභාගී වූ නියෝජිතයෝ ඉන්ෆෝම් ආයතනය සමග ප්‍රකාශ කර සිටියහ. නයිජීරියාවේ ගැහැණු ළමුන් පැහැර ගැනීම පිළිබඳ මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම රජය විසින් තහනම් කළ අතර එම සිදු වීම සමුළුවට සහභාගී වූ නියෝජිතයන්ගේ විරෝධතාවයක් දක්වා දුර දිග ගියේය.

රජයේ අමාත්‍යවරයෙක් මැයි දින රැලියේදී මාධ්‍යවේදියෙකුව තල්ලුකර දැමීමේ සිදුවීමත් සමග මේ මාසයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මර්දනය කිරීම ද ආරම්භ විය. එසේම මේ මාසය මුල් භාගයේ දී ජනමාධ්‍යවේදියෙකුව පැහැර ගෙන ගොස් හිරිහැර කිරීමේ සිදුවීමක් ද වාර්තා විය. නඩු විභාග ආවරණය කිරීම පිළිබඳ පොලීසිය විසින් අත්තනෝමතික තහනමක් පනවන ලද අතර ආරක්ෂක අංශ විසින් ජනමාධ්‍යවේදීන් සඳහා සූදානම් කර තිබූ පුහුණු වැඩමුළුවක් නවතා දමන ලදී. ඒ අතරම නවතම චිත්‍රපටයක නළුවෙකු මෙන්ම විපක්ෂ දේශපාලඥයෙකු වන සම්මාන දිනූ ප්‍රධාන පෙළේ රංගනවේදියෙකුගේ ජායාරූප ඇතුළත් දැන්වීම් පුවරු පොලීසිය විසින් කපා ඉවත් කරන ලදී. තහනම් කරනු ලැබූ වෙබ් අඩවි අතරට මැයි මාසයේදී අලුතින් තවත් වෙබ් අඩවි දෙකක් ඇතුළත් විය.

දමිළ දේශපාලන පක්ෂ මර්දනය කිරීම ද මේ මාසයේදී දිගටම ක්‍රියාත්මක විය. මානව හිමිකම් ක්‍රියාධරයකු ලෙස ක්‍රියාකරන දමිළ දේශපාලනඥයෙකු අත්අඩංගුවට ගැනීමක් වාර්තා වූ අතර හමුදාව විසින් දමිළ දේශපාලනඥයන්ගේ නිවෙස් වැටලීමක් ද, පහර දීමක් ද සිදු කරන ලදී. ඒ අතරම, ප්‍රධාන දෙමළ දේශපාලන පක්ෂය වන දමිළ ජාතික සන්ධානය රාජ්‍යද්‍රෝහී බවට රජයේ ඇමතිවරයකු චෝදනා කළේය. රජය විසින් පවත්වන වාර්ෂික විජයග්‍රහණ සැමරුම මෙවරත් යුද්ධය අවසන් වී වසර 5ක් ගත වූ මැයි 18 වන දින පවත්වන ලදී. කෙසේ වුවද, පෙර වර්ෂවලදී සිදු වූවාක් මෙන් දමිළ ජනතාව මේ දිනය යුද්ධයේදී මිය ගිය සහ අතුරුදහන් වූ සිය හිතවතුන් සිහි කර ශෝක වෙමින් නිහඬව ගත කරන ලදී. ආරක්ෂක අංශ සහ පොලීසිය විසින් මල් සහ පහන් වැනි මළගිය වුන් සිහිකිරීමට යොදා ගන්නා සංකේත පාගා දමමින්, ඒවාට ප්‍රහාර එල්ල කරමින්, ආගමික වතාවත් පැවැත්වීම තහනම් කරමින්, පූජකවරුන් සහ භක්තිකයන් ආගමික වතාවත්වලට සහභාගී වීම වළක්වමින් සහ ඔවුන්ව ප්‍රශ්න කරමින්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ ජනමාධ්‍යවේදීන් බිය ගන්වමින් කටයුතු කළ අතර, එසේම මළගිය සහ අතරුදහන් වූවන් සිහිකිරීමේ වැඩසටහන් සැහැසි ලෙස කඩාකප්පල් කරන ලදී. දමිළ දේශපාලන පක්ෂ කාර්යාල අසල දැඩි ලෙස ආරක්ෂක රැකවල් යොදා තිබුණු අතර විශේෂයෙන් උතුරු පළාතේ දමිළ පුවත්පත් සහ ආගමික ස්ථාන දැඩි බියකින් වැසී පැවතියේය. මියගියවුන් සිහි කිරීම සඳහා ආගමික සහ සංස්කෘතික වැඩසටහන් සංවිධානය කිරීමට යත්න දැරීමේ ඉතිහාසයක් සහිත යාපනය විශ්ව විද්‍යාලය මේ කාලය තුළ සතියක් වසා දමන ලදී.

පෙර මාසවල සහ පෙර වසරවල මෙන්ම, රජයේ අමාත්‍යවරුන්, පොලීසිය සහ හමුදාව බොහෝ සිද්ධිවලට සෘජුවම වගකිව යුතු වන අතර, මෙම ක්‍රියාවලට සෘජුවම වග කිවයුත්තන් කිසිදු දඬුවමක් හෝ දුර්විපාකයක් නොලබා නිදැල්ලේ සිටින්නේ සමහරක් සිද්ධි සම්බන්ධයෙන් ලබා දුන් පුළුල් මාධ්‍ය ආවරණයන් ද ඇතුළුව
පැහැදිලි සාක්ෂි සහිතව වගකිව යුතු රජයේ ආයතනවලට කළ පැමිණිලි ද පසෙක තිබියදීය.

## A. විරෝධතාවයක් සංවිධානය කිරීම හේතුවෙන් මානව හිමිකම් ආරක්ෂකයෙකු/දේශපාලන පක්ෂ ක්‍රියාකරුවෙකු අත්අඩංගුවට ගැනීම

### 1. මානව හිමිකම් ආරක්ෂකයෙකු/ දමිළ දේශපාලන පක්ෂයක සංවිධායකවරයෙකු අත්අඩංගුවට ගැනීම

ජාතික දමිළ මහජන පෙරමුණ (Tamil National People’s Front) හි මාධ්‍ය වාර්තාවන්ට අනුව එහි කිළිනොච්චි සංවිධායක තන්ගරාජ් ජගදීස්වරන් මහතාව සිය නිවසේ සිටියදී ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් 2014 මැයි 23 වන දින අත්අඩංගුවට ගන්නා ලදී.

කිලිනොච්චි පදිංචිකරුවන් සඳහා වන නැවත පදිංචිකිරීමේ කටයුතු සිදුකර අවසන් කිරීමට සහ ආරක්ෂක හමුදා මගින් ඔවුන්ගේ ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීමට රජයට බල කිරීම සඳහා මැයි 26 වන දින පැවැත්වීමට නියමිතව තිබූ විරෝධතා ව්‍යාපාරයක් සංවිධානය කිරීම හේතුවෙන් ජගදීශ්වරන් මහතාව අත්අඩංගුවට ගෙන ඇත. විරෝධතා ව්‍යාපාරය පැවැත්වීම සඳහා අවසර ලබා ගැනීමට කිලිනොච්චි පොලීසිය වෙත ලිපියක් භාර දීමෙන් පසු ජගදීශ්වරන් මහතාව වහාම පොලීසියට කැඳවා විරෝධතාවය නවතා දැමීමට බල කරන ලදී. එල්.ටී.ටී.ඊ සංවිධානය නැවත පණ ගැන්වීමේ කටයුතුවල නියැලෙන බවට සැක කරමින් ජගදීශ්වරන් මහතාව අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් රෝහණ මහතා ප්‍රකාශ කළේය[1].

## B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම

### 2. ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වරයා අධිකරණය ඉදිරියේ පෙනී සිටීම ආවරණය කිරීම ජනමාධ්‍යවලට තහනම් කිරීම සහ ආවරණය කිරීමෙන් වළකින ලෙස තර්ජනය කිරීම.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් මැයි 28 වන දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින්, ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ගොනු කරනු ලැබූ අපහාස නඩුව ආවරණය කිරීම වළක්වාලමින් පොලිසිය විසින් ජනමාධ්‍ය මත පැන වූ තහනම පිළිබඳ සිය බරපතල කණගාටුව ප්‍රකාශ කර සිටියේය. නීතිඥ එම්.ඒ. සුමන්දිරන් මහතා රාජපක්ෂ මහතාගෙන් හරස් ප්‍රශ්න විමසීම ආවරණය කිරීම පොලීසිය විසින් වළක්වා ලූ අතර රාජපක්ෂ මහතා අධිකරණ භූමියට පැමිණීම හෝ ඉන් පිට වීම වීඩියෝ ගත නොකරන ලෙස ද ජනමාධ්‍යවලට අනතුරු හැඟවූයේය[2]. එවැනි මාධ්‍ය ආවරණයක් ඕනෑම නඩුවිභාගයකදී සාමාන්‍ය දෙයක් වන අතර ගෝඨාභය රාජපක්ෂ මහතාට පමණක් මෙවැනි වරණීය සැළකීමක් ලබා දීම නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සිය මාධ්‍ය නිවේදනයෙන් ප්‍රශ්න කර සිටියේය. ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවි සංකීර්ණයට රථ පෙළ ලගා වනු වීඩියෝ ගත නොකරන මෙන් සහ එසේ කළ හොත් තුන් මසක් සඳහා රඳවා තබා ගැනීමේ නියෝග නිකුත් කරන බව පවසමින් පොලීසියේ ඉහළ නිලධාරීන් ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කරන ආකාරය බීබීසී සිංහල සේවයේ පළ කරන ලද කරන ලද වීඩියෝවකින් පෙන්නුම් කරයි[3].

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා මිග් ප්‍රහාරක යානා මිල දී ගැනීමේදී විශාල වශයෙන් දූෂණ සහ වංචා සිදු වී ඇති බව පෙන්වා දෙමින් 2008 වර්ෂයේදී පළ කළ ලිපි මාලාවක් සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් සන්ඩේ ලීඩර් පුවත්පතට එරෙහිව මෙම නඩුව ගොනු කර ඇත. 2014 මැයි 24 වන දින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ දී ගෝඨාභය රාජපක්ෂ මහතා මෙම නඩුවට සාක්ෂි ලබා දුන්නේය. මහජන උනන්දුවක් සහිත මෙම නඩු විභාගය ආවරණය කිරීම ජනමාධ්‍යවලට තහනම් කිරීම ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය උල්ලංඝණය කිරීමක් ද වේ.

---

[1] https://www.srilankamirror.com/news/15117-tnpf-k-nochchi-organiser-arrested (Last accessed on 10th June 2014)
[2] http://srilankabrief.blogspot.ch/2014/05/sri-lanka-security-forces-should.html#more (Last accessed on 10th June 2014)
[3] http://www.bbc.co.uk/sinhala/sri_lanka/2014/05/140527_gotabaya_court_video.shtml (Last accessed on 10th June 2014)

### 3. ආරක්ෂක හමුදාවන්ගේ බියගැන්වීම් නිසා ජනමාධ්‍ය පුහුණු වැඩමුළුව නවතා දැමීම

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් ශ්‍රී ලංකාවේ යහපාලනය සහතික කිරීම උදෙසා උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාව මගින් ඉදිරිපත් කළ නිර්දේශ සම්බන්ධයෙන් විමර්ශන ජනමාධ්‍යවේදී වාර්තා ලිවීමට ජනමාධ්‍යවේදීන් දිරි ගැන්වීමට හා ඔවුන් පුහුණු කිරීමට පැවැත්වූ වැඩමුළුව ආරක්ෂක අමාත්‍යාංශය විසින් අවලංගු කරන ලදී. මෙයට සමාන වැඩමුළුවක් සිංහල ජනමාධ්‍යවේදීන් සඳහා මීට පෙර පැවැත්වුනු අතර, දෙමළ ජනමාධ්‍යවේදීන් සඳහා වන මෙම වැඩමුළුව මැයි 22වැනි දින ගිරිතලේ, ඩියර් පාක් හෝටලයේ දී පැවැත්වීමට සැලසුම් කර තිබුණු අතර, මේ සඳහා උතුරු, නැගෙනහිර පළාත්වලින් සහ කොළඹින් දෙමළ සහ මුස්ලිම් ජනමාධ්‍යවේදීන් සහභාගි වීමට නියමිතව තිබුණි. කෙසේ නමුත්, සම්මන්ත්‍රණය පැවැත්වෙන අතරතුර දී හෝටල් පරිපාලනය විසින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත දැනුම් දෙනු ලැබුවේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා දෙන උපදෙස්වලට අනුව මෙම වැඩමුළුව තවදුරටත් පැවැත්විය නොහැකි බවයි[4].

### 4. අමාත්‍ය තොණ්ඩමන් මහතා මැයි දින රැලියකදී ජනමාධ්‍යවේදියෙකුව තල්ලු කිරීම

ලංකා කම්කරු කොන්ග්‍රසයේ මැයි දින රැලිය ආවරණය කරමින් සිටි ජනමාධ්‍යවේදියෙක්ව ලංකා කම්කරු කොන්ග්‍රසයේ නායක කැබිනට් අමාත්‍ය ආරුමුගම් තොණ්ඩමන් මහතා විසින් පසෙකට තල්ලු කර දමනු ලැබීය. මෙම සිදුවීම අවසථාවේදී අදාළ ජනමාධ්‍යවේදියා, බණ්ඩාරවෙල දී පැවති පක්ෂයේ මෙම රැලිය ආවරණය කරමින් සිට ඇත. දමිළ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මාධ්‍ය ප්‍රකාශක ඒ. නික්සන් මහතා මේ සිදුවීම පිළිබඳ මෙසේ කියා සිටියේය. "අමාත්‍යවරයෙකු මේ ආකාරයෙන් හැසිරෙන විට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මාධ්‍ය නිදහස පිළිබඳ තත්ත්වය කුමක්ද කියා තේරුම් ගන්න පුළුවන් " [5]. මෙම සිදුවීම සෙසු ජනමාධ්‍යවේදීන් විසින් වීඩියෝ ගත කර තිබු අතර රූපවාහිනී නාලිකා හරහා පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී[6]. ඉන්ෆෝම් ආයතනයට ලැබී ඇති තොරතුරු අනුව මේ සිදුවීම සම්බන්ධයෙන් මේ වන තෙක් අමාත්‍යවරයා විසින් සමාව ඉල්ලීමක් හෝ අමාත්‍යවරයාට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමක් සිදු වී නොමැත.

### 5. ජනමාධ්‍යවේදියෙකුව පැහැරගෙන ගොස් පහරදීමේ උත්සාහයක්

2014 මැයි 1 වන දින රත්නපුර ගොඩකවෙල ප්‍රදේශයේදී කිසියම් කණ්ඩායමක් විසින් නිවුස් ෆස්ට් හි ප්‍රාදේශීය වාර්තාකරුවෙකු වන මහින්ද පුෂ්පකුමාර මහතා පැහැරගෙන යාමේ උත්සාහයක් වාර්තා විය. උඩවලවේ ජාතික වන උද්‍යානයෙන් අලි පැටවෙකු පැහැර ගෙන යාමේ සිදුවීමක් වාර්තා කිරීමට උත්සාහ කිරීමේදී මෙම සිදුවීම සිදු වී ඇත. වන ජීවී නිලධාරීන් සහ ගම් වැසියන් විසින් පුෂ්පකුමාර මහතාව බේරා ගත් බව අදාළ මාධ්‍ය ජාලය විසින් වාර්තා කළ නමුත් සිදුවීම රූපගත කළ වීඩියෝ පට සොරා ගෙන තිබුණි. සිදුවීමෙන් අනතුරුව පුෂ්පකුමාර මහතාව රෝහල ගත කෙරුනු අතර ගොඩකවෙළ පොලීසියේ සහ පොලිස්පති හමුවේ පැමිණිළි ගොනු කරනු ලැබීය[7].

### 6. වෙබ් අඩවි අවහිර කිරීම - www.theindependent.lk

අන්තර්ජාල සේවා ප්‍රවර්ධකයින් විසින් සිය වෙබ් අඩවිය අවහිර කර ඇති බව www.theindependent.lk හි කර්තෘ සුභාෂ් ජයවර්ධන විසින් 2014 මැයි 29 වන දින ජාතික මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හා සම්බන්ධ 14(1)(ඒ) වගන්තිය මගින් ලබා දී ඇති මූලික අයිතිවාසිකම මෙම වාරණය හරහා කඩ වී ඇති බව ජයවර්ධන මහතා සිය පැමිණිල්ලෙන් දක්වා සිටියේය. සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම දෛනිකව ක්‍රියාත්මක වූ මෙම වෙබ් අඩිවිය "Independent Media Networks (pvt) Ltd යටතේ ක්‍රියාත්මක වූ ස්වාධීන ප්‍රවෘත්ති වෙබ් අඩවියක් බව පැමිණිල්ල මගින් කර්තෘවරයා දක්වා සිටියේය. අදාළ වෙබ් අඩවිය 2014 මැයි 20 වන දින සිට වාරණයට කර තිබේ [8].

---

[4] http://www.tisrilanka.org/?p=11979 (Last accessed on 1st July 2014)
[5] http://newsfirst.lk/english/2014/05/arumugam-thondaman-obstructed-journalist-media-organisations-condemn-behaviour/33439 (Last accessed on 10th June 2014)
[6] https://www.youtube.com/watch?v=pr-bNU1s7Iw#t=79 (කරුණාකර 1.12- 1.14 බලන්න) (Last accessed on 10th June 2014)
[7] http://newsfirst.lk/english/2014/05/newsfirst-correspondent-attempted-rescue-elephant-calf-attacked/33442
[8] https://www.srilankamirror.com/news/15185-theindependent-lk-complaints-to-hrc-over-blockade (Last accessed on 10th June 2014)

## 7. වෙබ් අඩවි අවහිර කිරීම – www.srilankamirror.lk

2014 මැයි 12 වන දින සිට ශ්‍රී ලංකාවේ සියළුම අන්තර්ජාල සේවා ප්‍රවර්ධකයින් විසින් www.srilankamirror.lk වෙබ් අඩවිය වාරණය කර ඇති බව ශ්‍රී ලංකා ජාතික මානව හිමිකම් කොමිසම වෙත පෙත්සමක් ඉදිරිපත් කරමින් එහි කර්තෘ කැළුම් ශිවන්ත ප්‍රකාශ කර සිටියේය.

මෙම අයුතු ක්‍රියාමාර්ග හේතුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබා දී ඇති අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මෙන්ම නීතිය ඉදිරියේ සමානව සැලකුම් ලැබීමට ඇති අයිතිය පැහැදිළිවම උල්ලංඝණය වී ඇති බව දක්වමින් මෙම සිදුවීම පිළිබඳ ඉක්මන් ක්‍රියාමාර්ග ගන්නා මෙන් පෙත්සමෙන් ඉල්ලා ඇත. විදුලි සංදේශ නියාමන කොමිසම විසින් කළ නිර්දේශයකට අනුව මෙම වාරණය පැනවූ බව අන්තර්ජාල ප්‍රවර්ධකයින් විසින් වාචිකව තමන්ට දැන්වූ බව ශිවන්ත මහතා මාධ්‍යයට ප්‍රකාශ කර සිටියේය[9].

2005 වර්ෂයේදී පළමු වතාවට ප්‍රවෘත්ති වෙබ් අඩවියක් වන www.tamilnet.com වෙබ් අඩවිය වාරණය කරන ලදී. ඉන් පසු කාලය තුළ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් ක්‍රියාත්මක වන වෙබ් අඩවි ගණනාවක් ශ්‍රී ලංකාව තුළ වාරණයට ලක් කර ඇති අතර ඉන් බොහොමයක් රජය පිළිබඳ විවේචනාත්මක ප්‍රවෘත්ති පළ කරන ඒවාය. මේ ආකාරයෙන් රජය විසින් වෙබ් අඩවි වාරණය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ කොමසාරිස්වරයකු මාධ්‍ය වෙත ප්‍රකාශ කර සිටියේය[10]. නමුත් ඉන්ෆෝම් ආයතනයේ දැනුමට අනුව, ඉහත පැමිණිලි කෙරෙන තුරුම මානව හිමිකම් කොමිසම විසින් වසර ගණනාවක් තිස්සේ කෙරී ගෙන යන මේ වෙබ් අඩවි වාරණය සම්බන්ධයෙන් කිසිදු විධිමත් සහ ස්ථාවර ක්‍රියාමාර්ගයක් ගෙන නැත්තේ, මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් සිය ස්වාධීන අභිමතය පරිදි විමර්ශන ආරම්භ කිරීමට, මූලික මානව හිමිකම් කඩවීම් සම්බන්ධව රජයට සිය නිගමනයන් නිල වශයෙන් භාර දීමට, වෙබ් අඩවි ලියාපදිංචි කිරීම වැනි කාරණා ව්‍යවස්ථාවිරෝධී බවට රජයට උපදෙස් දීමට ආදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට නිල වශයෙන් බලය ලබා දී තිබිය දීය.




ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පෙත්සම භාර දීමෙන් පසු ජනමාධ්‍යවේදීන් සහ විපක්ෂයේ දේශපාලනඥයින් ඡායාරූපයකට පෙනී සිටින අයුරු (ඡායාරූපය - Sri Lanka Mirror)

මැයි 24 වන දින ෆේස් බුක් සහ ට්විටර් ඇතුළු සිය සමාජ වෙබ්අඩවිවලට සයිබර් ප්‍රහාර ගණනාවක් එල්ල වූ බව ශ්‍රී ලංකා මිරර් වාර්තා කළේය[11].

---

9 http://www.theindependent.lk/index.php/news2/3577-a-petition-to-hrc-against-sl-web-blockade (Last accessed on 10th June 2014)

10 http://www.theindependent.lk/index.php/news2/3617-blocking-websites-is-a-violation-of-the-constitution-hrc-chairman (Last accessed on 10th June 2014)

11 https://www.srilankamirror.com/news/15118-cyber-attack-attempts-on-mirror-emails-social-media-accounts (Last accessed on 10th June 2014)

## 8. දේශපාලනඥයෙකු වන රංගනවේදියෙකුගේ ඡායාරූප ඇතුලත් චිත්‍රපට දැන්වීම් පුවරු පොලීසිය විසින් ඉවත් කිරීම

රන්ජා නැමති නව චිත්‍රපටයේ දර්ශනවාර ආරම්භ කිරීම පිළිබඳ බොරැල්ල රිට්ස් සිනමා ශාලාව ඉදිරිපිට ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 2014 මැයි 28 වන දින පොලීසිය විසින් ඉවත් කරන ලදී. එක්සත් ජාතික පක්ෂයේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මහතා මෙම චිත්‍රපටයේ ප්‍රධාන චරිතයක් රඟ දක්වයි. රන්ජන් රාමනායක මහතා පෙනී සිටින මෙම දැන්වීම් පුවරුවේ 'රතුපස්වල රන්ජා සහ අවනීතියේ රජවරුන් ගේ හෙළිදරව්ව' යනුවෙන් සටහන්ව තිබුණි. චිත්‍රපට ශාලාවේ කළමණාකරු විසින් බොරැල්ල පොලිසීය වෙත කළ පැමිණිල්ල භාර ගැනීම පොලීසිය විසින් ප්‍රතික්ෂේප කර ඇත[12]. 2013 අගෝස්තු මාසයේදී රතුපස්වල අපවිත්‍ර ජලය සම්බන්ධයෙන් ඇති වූ නොසන්සුන් තත්ත්වයේදී පුද්ගලයන් තුන් දෙනෙක් වෙඩි වැදී මිය ගිය අතර කිහිප දෙනෙක් තුවාල ලැබූහ. රන්ජන් රාමනායක මහතා 2014 වර්ෂයේදී නොකඩවා සත් වැනි වතාවටත් ජනප්‍රියම නළුවා ලෙස තේරී පත් විය. දැන්වීම් පුවරුව දිගටම ප්‍රදර්ශනය කිරීමට නම් ඉන් 'අවනීතියේ රජවරුන් නිරුවත් කළ යුක්තියේ පුනරාගමනය' යන්න ඉවත් කිරීමට පොලීසියට අවශ්‍ය වූ බව මාධ්‍ය වාර්තා කළේය[13].

## 9. ලෝක තරුණ සමුළුවට ආ නියෝජිතයන් විසින් සංවිධානය කළ මාධ්‍ය හමුව අමාත්‍යවරයෙකු විසින් තහනම් කිරීම.

නයිජීරියාවේ බොකෝ හරාම් සටන්කාමීන් විසින් පාසල් ශිෂ්‍යාවන් 300 කට ආසන්න සංඛ්‍යාවක් පැහැර ගැනීම පිළිබඳව 2014 මැයි 6 වන දින සිට 10 වන දින දක්වා කොළඹ දී පැවති ලෝක තරුණ සමුළුවට පැමිණි නියෝජිතයන් විසින් සංවිධානය කළ මාධ්‍ය හමුව තරුණ කටයුතු පිළිබඳ අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා විසින් තහනම් කරන ලදී[14].

"මොවුන්ට යටි අදහසක් තිබෙනවා. ඒ වගේම මේ සිදුවීම තරුණ සමුළුවට අදාළත්වයක් නැහැ. එම නිසා මෙම මාධ්‍ය හමුවට අපි ඉඩ දිය යුතුයි මම හිතන්නේ නෑ." යනුවෙන් අමාත්‍යවරයා මාධ්‍යයට පැවසූ බව වාර්තා විය. "මෙය අපේ වැඩසටහන. ලෝකය අපේ තත්ත්වය ගැන දැන ගන්න ඕනේ. ඒ වගේම මේ අසාධාරණය පිළිබඳව ප්‍රචාරය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා". යනුවෙන් තරුණ නියෝජිතයෝ ප්‍රකාශ කළහ. සමුළුවට පැමිණි නියෝජිතයන් කණ්ඩායමක් විසින් 'Bring back our girls' යනුවෙන් සටහන් වූ පුවරු රැගෙන අමාත්‍යවරයාගේ තීරණයට විරුද්ධව විරෝධතා ව්‍යාපාරයක්ද පවත්වන ලදී,




මාධ්‍ය හමුව පැවැත්වීම තහනම් කිරීම පිළිබඳව ජාත්‍යන්තර නියෝජිතයන් විසින් තරුණ සමුළුවේදී කළ විරෝධතාවය. 2014 මැයි 09. (ඡායාරූපය - සංඛ විදානගම )

[12] https://www.srilankamirror.com/news/14943-police-remove-ranja-s-cutouts (Last accessed on 10th June 2014)
[13] http://lankaenews.com/English/news.php?id=14217 (Last accessed on 10th June 2014)
[14] http://www.ceylontoday.lk/51-63517-news-detail-african-delegates-protest-at-bmich.html (Last accessed on 10th June 2014)

### 10. රජය යටතේ පාලනය වන පුවත්පතක් වන ඩේලි නිවුස් පුවත්පත විසින් රාජ්‍ය නොවන සංවිධානයකට පිළිතුරු දීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීම

ජාතික සාම මණ්ඩලයේ (NPC) විධායක අධ්‍යක්ෂක ආචාර්ය ජෙහාන් පෙරේරා පිළිබඳව ඩේලි නිවුස් පුවත්පත පළ කරන ලද පෞද්ගලික වෛරීසහගත ප්‍රකාශය පිළිබඳව ඒ මහතාට ඇති පිළිතුරු දීමේ අයිතිය අදාළ පුවත්පත විසින් ප්‍රතික්ෂේප කරන ලදී. කතුවැකියේ සහ ප්‍රධාන විශේෂාංග ලිපිය තුළ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයෙකුට මෙසේ පිළිතුරු දීමේ අයිතිය ලබා නොදීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝණය කිරීමක් බව ජාතික සාම මණ්ඩලය ප්‍රකාශ කර සිටියේය[15]. මෙම පෞද්ගලික වෛරීසහගත ප්‍රකාශයට පදනම වූයේ යුද විජයග්‍රහණ සැමරුම් දිනයක් වෙනුවට ජාතික අනුස්මරණ දිනයක් පැවැත්වීම පිළිබඳ ජාතික සාම මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අදහසකි. ජාතික සාම මණ්ඩලයේ මෙම අදහස සම්බන්ධයෙන් ඩේලි නිවුස් හි කර්තෘවරයා විසින් ජාතික සාම මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය ජෙහාන් පෙරේරා මහතාව පෞද්ගලිකව විවේචනය කරමින් කතුවැකියක් සහ විශේෂාංග ලිපියක් පළ කළේය.

## C. සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම්

### 11. ලෝක කම්කරු දිනය පිළිබඳව රජරට විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කළ සම්මන්ත්‍රණයට බාධා පැමිණවීම.

2014 මැයි 05 වන දින රජරට විශ්ව විද්‍යාලයේදී පැවැත්වීමට නියමිතව තිබූ ලෝක කම්කරු දිනය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා අවසර ලබා දීම විශ්ව විද්‍යාලයයීය පරිපාලනය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු මෙම සම්මන්ත්‍රණය ඇමතීමට නියමිතව තිබූ නිසා මෙම සම්මන්ත්‍රණය වැළැක්වූ බව ප්‍රකාශ විය. කෙසේ වුවද අදාළ සම්මන්ත්‍රණය විශ්ව විද්‍යාල භූමියෙන් පිටතදී පැවැත්විණි.

### 12. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ විරෝධතා රැලියක් නවතා දැමීමට පොලීසිය විසින් අධිකරණ නියෝගයක් ලබා ගැනීම

මැයි 07 වන දා පැවැත්වීමට නියමිතව තිබූ විරෝධතා රැළිය තහනම් කරමින් සහ අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ ක්‍රියාකාරීන් 17 දෙනෙකුට විරුද්ධව පොලීසිය විසින් 2014 මැයි 06 වන දින අධිකරණ නියෝගයක් ලබා ගන්නා ලදී. මේ නියෝගයේ පිටපත් මැයි 06 වන දින ශිෂ්‍ය නේවාසිකාගාරවලට බෙදා හැර ඇත. විරෝධතා රැළිය පැවැත්වීමට නියමිතව තිබුනේ ලෝක තරුණ සමුළුව පැවත් වූ කාලය අතරතුර වීම මෙම තහනම් නියෝගයට හේතු විය. ශිෂ්‍ය ක්‍රියාකාරීන් බිය වැද්දවීම සඳහා කිහිප වරක් පොලීසිය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ නිවෙස් වලට පැමිණ ඇති අතර ඇතැමුන් ගේ නිවෙස්වලට පොලීසිය සය වතාවක් පමණ පැමිණ ඇත. ශිෂ්‍යයින් 17 දෙනා අතඅඩංගුවට ගැනීමෙන් පසුව ද අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් සමග පොලීසිය විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරුගේ නිවසට ගොස් ඇත. අත්අඩංගුවට ගත් ශිෂ්‍යයන් 17 දෙනා පසුව ඇප මත මුදා හරින ලදී.

### 13. ශිෂ්‍ය විරෝධතාකරුවන් පොලීසිය මගින් අත්අඩංගුවට ගැනීම සහ පහර දීම

2014 මැයි 16 වන දින විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 17 දෙනෙකු පොලීසිය විසින් අත්අඩංගුවට ගත් අතර ඉන් කිහිප දෙනෙකුට පොලීසිය විසින් පහර දී ඇත. එහිදී සිදුවූ තුවාල හේතුවෙන් ශිෂ්‍යයන් සිවු දෙනෙකු කොළඹ ජාතික රෝහලට ඇතුළත් කළ අතර රෝහල් ගත නොවූ තුවාල ලැබූ තවත් ශිෂ්‍යයන් දෙදෙනකු ද සිටි බව ශිෂ්‍යයෝ ප්‍රකාශ කර සිටියහ. මෙම ප්‍රකාශය පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරන ලදී[16].

“සිවිල් ඇඳුමින් සැරසුණු පුද්ගලයෝ ඔවුන්ට (ශිෂ්‍යන්ට) මහජනයා බලා සිටිය දී ප්‍රසිද්ධියේ පහර දී පොලීසියට අරන් ගියා. ඔවුන්ව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ තිළිණ ගමගේ මහතා ඉදිරියේ ඉදිරිපත් කරන විට පවා ඔවුන්ගේ සිරුරුවලින් ලේ ගලමින් තිබුණා” මාධ්‍යයට අදහස් දැක් වූ අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල

[15] http://srilankabrief.blogspot.ch/2014/05/sri-lanka-govt-flagship-english-daily.html#more (Last accessed on 10th June 2014)

[16] http://www.sundaytimes.lk/140518/news/ahs-undergraduate-activists-assaulted-in-police-custody-and-hospitalised-99597.html (Last accessed on 10th June 2014)

මණ්ඩලයේ ප්‍රකාශක ලහිරු මධුසංඛ පැවසුවේය.[17]. මේ අතර පාඨමාලා කාලය වසර 4ක් වූ සම සෞඛ්‍ය උපාධි පාඨමාලාව වසර තුනක සාමාන්‍ය උපාධියක් බවට පත් කිරීමට එරෙහිව පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය සම සෞඛ්‍ය පීඨයේ ශිෂ්‍යයෝ නොකඩවා උද්ඝෝෂණයේ යෙදෙමින් සිටිති. සම සෞඛ්‍ය උපාධිය තත්වයෙන් පහළ හෙළීම පිළිබඳව සම සෞඛ්‍ය ශිෂ්‍ය සංගමය (AHSSU) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයාට චෝදනා එල්ල කරයි[18].



පහරදීමට ලක් වූ එක් ශිෂ්‍යයෙක් (ඡායාරූපය - ලංකා ට්රුත්)

සම සෞඛ්‍ය උපාධියේ ගුණාත්මකභාවය සහ කාල සීමාව අඩු කිරීම පිළිබඳව ශිෂ්‍යයන්ගේ විරෝධතාවය සාධාරණ බවත්, මොවුන් මාස තුනකට අධික කාලයක් තිස්සේ අදාළ ආයතන දැනුවත් කර ඇති නමුත් ඔවුන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නොමැති බවත් විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපති චන්ද්‍රගුප්ත තේනුවර මහතා ප්‍රකාශ කර සිටියේය[19].

## 14. ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ මැයි දින රැලිය සඳහා වෙන්කර තිබුණ ස්ථානය අහිමි කිරීම

සිය මැයි දින රැලිය සඳහා පෙර වසර වලදී මෙන් හයිඩ් පාක් කෝනර් පිටිය වෙන් කර ඇති බව පොලීසිය තමන්ට වාචිකව දැන්වූ බව වෘත්තීය සංගම් නායකයෝ ඉන්ෆෝම් ආයතනය වෙත පැවසූහ. කෙසේ වුවත් පොලීසිය විසින් රජයට පක්ෂපාතී වෘත්තීය සමිතියකට ඔවුන්ගේ මැයි දින රැලිය සඳහා අදාළ පිටිය ලබා දී ඇති බවත් සිය මැයි දින රැලිය හයිඩ් පාක් පිටියේදී පැවැත්වීම නැවැත්වීම සඳහා පොලීසිය විසින් අධිකරණ නියෝගයක් ලබා ගෙන තිබූ බවත් ඒකාබද්ධ වෘත්තීය සමිති සංධානය කියා සිටී. තවද හයිඩ් පාක් පිටියට කිලෝමීටර් ගණනාවකට මෙහා කොම්පඤ්ඤවීදිය මං සන්ධියේදී මෙම මැයි දින රැලියට පොලීසිය විසින් බාධා එල්ල කර ඇති අතර පසුව, අධිකරණ නියෝගය උල්ලංඝණය කර ඇති බව දක්වමින් වෘත්තීය සමිති නායකයන් තිදෙනෙකුට එරෙහිව චෝදනා එල්ල කර ඇත. මේ සිදුවීම වෙබ් අඩවි කිහිපයක්ද වාර්තා කර තිබුණි[20].

---

17 http://www.sundaytimes.lk/140518/news/ahs-undergraduate-activists-assaulted-in-police-custody-and-hospitalised-99597.html (Last accessed on 10th June 2014)
18 http://www.nation.lk/edition/news-online/item/20986-ahs-students-fight-for-four-year-degree.html#sthash.yEL8BHg8.dpuf (Last accessed on 10th June 2014)
19 http://www.lankanewspapers.com/news/2014/5/87995.html (Last accessed on 10th June 2014)
20 http://www.srilankannursing.net/May%20day%202014.html ((Last accessed on 10th June 2014)) – in Sinhalese



ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ මැයි දින රැළිය කොම්පඤ්ඤවීදිය වීදියේදී පොලීසිය විසින් අවහිර කිරීම
(ඡායාරූපය - Nurse Karapitya face book)

### 15. වැඩ වර්ජනයේ නිරත වුණ හොල්සිම් කම්කරුවන් ට පහර දීම

සිය සේවා ධූරය ස්ථිර කරන මෙන් ඉල්ලා වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක නියැලුණු හොල්සිම් ආයතනයේ කම්කරුවන් වෙත මැයි 24 වන දින ගාල්ල හොල්සිම් කර්මාන්තශාලාව ඉදිරිපිට දී මැර කණ්ඩායමක් විසින් පහර දෙනු ලැබීය. අන්තර් කම්කරු සේවකයන්ගේ සංගමයේ ජ්‍යෂ්ඨ නියෝජ්‍ය සභාපති සෝමදාස වීරතුංග සහෝදරයා කියා සිටියේ පහර දීම හේතුවෙන් එක් කම්කරුවෙකු රෝහල් ගත කිරීමට සිදු වූ බවයි[21].

වසර 15කට අධික කාලයක් සේවය කිරීමෙන් පසුව ද සේවා ධූරය ස්ථිර නොකිරීම හේතුවෙන් පුත්තලම අරුවක්කුඩුව සහ ගාල්ල හොල්සිම් කර්මාන්තශාලාවල කම්කරුවන් 500කට ආසන්න පිරිසක් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල නියැලුණහ. කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන ඇති සේවකයන්ගේ පැය 8 වැඩ කාලය, ස්ථිර වේතන සහ අතිකාල දීමනා ප්‍රතික්ෂේප වී ඇති අතර, සේවක භාරකාර අරමුදලට සහ අර්ථසාධක අරමුදලට මුදල් බැර කිරීමේදී දූෂණ වංචා සිදු වී ඇති බව වෘත්තීය සමිතිය කියා සිටී.

## D. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය කිරීම

### 16. අමාත්‍යවරයෙකු විසින් රාජ්‍ය ද්‍රෝහී ක්‍රියාවක් සඳහා ද්‍රවිඩ ජාතික සන්ධානයට චෝදනා එල්ල කිරීම

ද්‍රවිඩ ජාතික සන්ධානය රාජ්‍ය විරෝධී යැයි පවසමින් ඩේලි නිවුස් පුවත්පතේ පළ වූ පුවෘත්තියක් ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවියේ නැවත පළ කරන ලදී. විදේශ ත්‍රස්තවාදී කණ්ඩායම් සහ දමිළ ඩයස්පෝරාව සමග සම්බන්ධකම් ඇති පුද්ගලයන් සහ සංවිධාන කෙරෙහි පනවා ඇති තහනම ඉවත් කරන මෙන් නොයෙකුත් යෝජනා සම්මත කිරීම මගින් ද්‍රවිඩ ජාතික සන්ධානය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ දරුණු රාජ්‍ය විරෝධී ක්‍රියාවක නිරත වන බවට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා කළ ප්‍රකාශයක් උපුටා දක්වමින් මෙම ප්‍රවෘත්තිය පළ විය[22].

---

21 http://www.unions.lk/site/index.php?option=com_content&view=article&id=247:thug-attack-on-holcim-employees&catid=88:news&Itemid=1166 (Last accessed on 10th June 2014)
22 http://www.defence.lk/new.asp?fname=TNA_Says_UN_BAN_BAN_20140430_01 (Last accessed on 10th June 2014)

### 17. යාපනය නගර සභාවේ විපක්ෂ නායකගේ නිවසට පහර දීම

යාපනය නගරසභාවේ විපක්ෂ නායක රජදේවන් මහතාගේ නිවසට මැයි 30 වන දා නන්නාඳුනන කණ්ඩායමක් විසින් පහර දෙන ලදී. යතුරු පැදි වලින් පැමිණි මේ පිරිස නිවසේ ඉදිරිපස ජනේලයට ගල් ප්‍රහාරයක් එල්ල කර ඇත. මුල්ලවයික්කාල් අවසන් සටනේදී මිය ගිය පිරිස සිහි කළ යුතු බවට යෝජනාවක් ගෙන ඒ සම්බන්ධයෙන් රජදේවන් මහතා කටයුතු කිරීම මෙම ප්‍රහාරයට හේතු වූ බව දමිළ මාධ්‍ය ප්‍රකාශ කර සිටියේය[23].

### 18. ද්‍රවිඩ ජාතික සන්ධානයේ සංවිධායකගේ නිවස ආරක්ෂක අංශ විසින් වටලීම

ආරක්ෂක හමුදා විසින් උතුරු පළාත් සභාවේ සාමාජික පසුබතිපිලෙ මහතාගේ කිලිනොච්චියේ තිරුනගර්හි පිහිටි නිවස මැයි 28 වැනි දින උදෑසන 4 පමණ සිට 8.30 දක්වා වටලා පවුලේ ලිය කියවිලි පරීක්ෂා කර ඇත[24].

## E. දමිළ ප්‍රජාව විසින් සිදු කළ සිහිපත් කිරීම් මර්දනය කිරීම

### 19. ආගමික ස්ථාන වලට අනතුරු ඇඟවීම; ප්‍රසිද්ධියේ සිහිපත් කිරීම් සිදු කිරීම තහනම් කිරීම

ඉරිදා දිනයේ ලෝකය පුරා සිටින ක්‍රිස්ත්‍රියානි ජනතාව සිය ආගමික ස්ථානවල පැවැත්වෙන පූජාවන්ට සහභාගී වුව ද ඉරිදා දිනයක් වූ මැයි 18 වන දින තමන්ට සිය ආගමික ස්ථානවලට යාම ආරක්ෂක හමුදා විසින් වළක්වා ලූ බව පූජකවරුන් ඇතුළු කිහිප දෙනෙක් ඉන්ෆෝම් ආයතනය වෙත පැවසූහ. මැයි මස තෙවැනි සතියේ මුල සිටම ආගමික සහ පොදු ස්ථානවල මළගිය වුන් සිහි කිරීම සහ මැයි 17 සහ 18 වන දිනවල සංඨාර නාද කිරීම ආරක්ෂක හමුදා විසින් තහනම් කරන ලදී[25]. ප්‍රසිද්ධ ස්ථානවල මළ ගියවුන් සිහි කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා අවසර ලබා නොදෙන බවත් ජනතාවට අවශ්‍ය නම් ඔවුන්ගේ නිවෙස්වල පෞද්ගලිකව සිහි කිරීමේ කටයුතුවල නියැලිය හැකි බවත් යුද හමුදා මාධ්‍ය ප්‍රකාශක රුවන් වනිගසූරිය මහතා මැයි 18 වන දින මාධ්‍යයට පැවසීය[26]. ජාතික ආරක්ෂාවට හානියක් සිදු විය හැකි නිසා එම සිහි කිරීමේ වැඩසටහන් නවත්වා දැමූ බව පොලීසිය පසුව පැවසීය[27].

### 20. ආගමික සැමරුම් වලට බාධා එල්ල කිරීම සහ තහනම් කිරීම; මහජන නියෝජිතයන් නැවැත්වීම

සිය සැමියා සහ මිය ගිය ඥාතීන් සිහි කිරීම සඳහා හින්දු පූජස්ථානයකට ඇතුළු වීමට යාමේ දී ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් තමන්ට අසභ්‍ය වචනයෙන් බැන වැදුණු බවට උතුරු පළාත් සභා මන්ත්‍රීනියක් සහ එල්.ටී.ටී.ඊ සටන්කාමීන් හමුදාවට යටත් වූ 2009 මැයි 18 වන දා සිට අතුරුදහන්ව සිටින සටන්කාමී නායකයෙකු ගේ බිරිඳ වන ආනන්දි සශිධරන් මහත්මිය පැවසුවාය[28]. මේ දිනයේදී මළගිය වුන් සිහි කිරීම වෙනුවෙන් ආගමික වතාවත්වලට සහභාගි වූ ජනයා සහ දමිළ ප්‍රජාව තුළ කිසියම් නායකත්වයක් දරන්නන් එක් රැස්ව සිටි ස්ථානවල ආරක්ෂක හමුදා සාමාජිකයන් ද එම සෙනඟ තුළට මිශ්‍රවී සිටි බව වාර්තා විය[29].

එසේම කිසියම් කණ්ඩායමක් විසින් දමිළ දේශපාලනඥයින්ට අසභ්‍ය වචනයෙන් අමතන සහ ඔවුන්ගේ ආගමික වතාවත්වලට යොදා ගන්නා පොල් ගෙඩි බලෙන් පාගා දමන ආකාරය දමිළ මාධ්‍ය කිහිපයක් විසින් අන්තර්ජාලයේ පල කළ වීඩියෝ දර්ශන වලින් දක්වනු ලැබිණි. පොල් ගැසීම ශිව භක්තිකයන්ගේ ආගමික

---

[23] http://www.tamilcnn.ca/house-rajadevan-attacked-inviting-mullivaikkaal-remembrance-day.html (Last accessed on 10th June 2014)

[24] http://www.lankasrinews.com/view.php?22AOlv2acJ5YAe4e4eMMc02aAmB3dd3PBmc30366AY2e4UY550ca2lOId3 (Last accessed 5th June 2014)

[25] http://www.globaltamilnews.net/GTMNEditorial/tabid/71/articleType/ArticleView/articleId/107107/language/en-US/article.aspx (Last accessed on 10th June 2014)

[26] http://www.sundaytimes.lk/140518/news/memorials-blood-donation-banned-in-north-east-99572.html (Last accessed on 10th June 2014)

[27] http://www.adaderana.lk/news/war-remembrance-service-a-threat-to-harmony-police- (Last accessed on 10th June 2014)

[28] http://www.reuters.com/article/2014/05/18/us-sri-lanka-war-celebrations-idUSBREA4H09B20140518 (Last accessed on 10th June 2014)

[29] https://www.youtube.com/watch?v=x0iqbamHavc (Last accessed on 10th June 2014)

වතාවත්වලින් එකකි[30]. සිහිකිරීමේ වැඩසටහනක් සඳහා දමිළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් විසින් වවුනයාවේ සමූපකාර ශාලාව වෙන් කර තිබුණද පොලීසියේ උපදෙස් මත එය අවලංගු කරනු ලැබීය[31].



උතුරු පළාත් සභා නියෝජිත ආනන්දි සශිධරන් මහත්මිය සිය අතුරුදහන් වූ සැමියා වෙනුවෙන් ආගමික වතාවත් සිදු කිරීම ආරක්ෂක හමුදා විසින් වළක්වාලීම සම්බන්ධයෙන් තනි පුද්ගල විරෝධතාවයක නියැලෙන අයුරු.
(ඡායාරූපය: Tamil Gaurdian)

### 21. පළාත් මහ ලේකම් කාර්යාලය අවහිර කිරීම; පුෂ්පෝපහාර පාගා විනාශ කර දැමීම

යාපනය පළාත් මහලේකම් කාර්යාලය ඉදිරිපිට තිබූ පුෂ්පෝපහාර පොලිස් නිලධාරීන් විසින් පාගා විනාශ කර දමන ලදී. දමිළ දේශපාලන නායකයින් විසින් දල්වා තිබුණු කපුරු පහන පොලිස් නිලධාරීන් විසින් කඩා කුඩු කර දමන ආකාරය දමිළ මාධ්‍ය විසින් අන්තර්ජාලයේ පළ කරන ලද කෙටි වීඩියෝ පටයක දැක්වේ. මේ අතර සිහිකිරීමේ වැඩසටහනට දේශපාලනඥයන් සහභාගී වීම වැළැක්වීම සඳහා උතුරු පළාත් සභා කාර්යාලයට පොලිස් බාධක යොදා තිබුණි[32].

### 22. ආරක්ෂක හමුදා විසින් පුවත්පත් සහ දේශපාලන පක්ෂ කාර්යාලයක් අවහිර කිරීම

යාපනයේ පළ වන ප්‍රධාන දිනපතා දමිළ පුවත්පතක් වන උදයන් පුවත්පත් කාර්යාලය ආරක්ෂක හමුදා විසින් වටලනු ලැබූ අතර පුවත්පත් කාර්යාලයට ප්‍රවේශ වීමට තිබූ නාවලර් පාර සහ කස්තුරියාර් පාරවල් දෙකම හමුදාව විසින් අවහිර කරන ලදී. එසේම එම පාරවල්වලට ඇතුළු වන සියලුම පුද්ගලයන් ප්‍රශ්න කිරීමට භාජනය කළ අතර ඉන් ඇතැමෙක් ආපසු හරවා යවන ලදී[33]. තවද යාල් තිනක්කුරල් පුවත්පතේ යාපන කාර්යාලය ද ආරක්ෂක හමුදා විසින් අවහිර කරන ලදී[34]. මැයි 18 වන දින උදැසන දමිළ මහජන පෙරමුණේ[35] සහ දමිළ ජාතික සන්ධානයේ කාර්යාල ආයුධ රැගත් විශාල හමුදා කණ්ඩායම් විසින් අවහිර කර තිබුණි[36]. කිලිනොච්චියේ පිහිටි දමිළ ජාතික සන්ධානයේ කාර්යාලය ද ආරක්ෂක හමුදා විසින් වට කරනු ලැබූ අතර එහි පැවති සිහි කිරීමේ උත්සවයට සහභාගී වීමට පැමිණි ජනතාවට කාර්යාලයට ඇතුළු වීමට ඉඩ නොදෙන ලදී. ඉන් අනතරුව ජනතාව ක්‍රිෂ්ණන් හින්දු කොවිල අසලට රැස්වී මළ ගිය වුන් සිහි කරනු ලැබූහ.

---

30 https://www.youtube.com/watch?v=6-WVmXDidOU (Last accessed on 10th June 2014)
31 http://www.sundaytimes.lk/140518/news/memorials-blood-donation-banned-in-north-east-99572.html (Last accessed on 10th June 2014)
32 http://www.tamilnet.com/art.html?catid=13&artid=37215 (Last accessed on 10th June 2014)
33 http://www.dailymirror.lk/news/47226-roads-blocked-in-jaffna.html (Last accessed on 10th June 2014)
34 http://www.globaltamilnews.net/GTMNEditorial/tabid/71/articleType/ArticleView/articleId/107107/language/en-US/article.aspx (Last accessed on 10th June 2014)
35 http://www.tamilguardian.com/article.asp?articleid=10940 (Last accessed on 10th June 2014)
36 http://www.tamilguardian.com/article.asp?articleid=10942 (Last accessed on 10th June 2014)

## 23. ලේ පරිත්‍යාග කිරීම වැළැක්වීම; යාපනය රෝහලේ ලේ බැංකුව වසා දැමීම

මැයි 18 වැනිදා ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහන් ද අවහිර කරන ලදී. ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහන්වලට සහයෝගය නොදක්වන මෙන් යාපනය මහ රෝහලට සහ සෙසු රෝහල්වලට පොලීසිය විසින් දැනුම් දී තිබුණි. මැයි 18 වනදා ජනතාව ලේ පරිත්‍යාග කිරීමෙන් වැළැක්වීම සඳහා යාපනය රෝහලේ ලේ පරිත්‍යාග කිරීමේ අංශය හමුදාව විසින් වසා දැමූ බව වාර්තා විය[37].

## 24. යාපනය විශ්ව විද්‍යාලය වසා දැමීම

මැයි 16 වන දින සිට 20 වන දින දක්වා යාපනය විශ්ව විද්‍යාලය වසා දමන බව මැයි 5 වන දින විශ්ව විද්‍යාල රෙජිස්ට්‍රාර්වරයා විසින් ලිපියක් මගින් දැනුම් දෙනු ලැබිය. වසාදැමීම සඳහා කිසිදු හේතුවක් එහි සඳහන් වූයේ නැත[38]. යුද්ධාවසානයේදී මිය ගිය පුද්ගලයන් වෙනුවෙන් සිහි කිරීමේ උත්සවයක් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විසින් සූදානම් කර තිබුණ අතර එය වැළැක්වීම සඳහා මෙසේ විශ්ව විද්‍යාලය වසා දැමූ බව සිතිය හැකිය.

## 25. යාපනයේ දමිළ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට, ශිෂ්‍යයින්ට සහ ජනමාධ්‍යවේදීන්ට මරණ තර්ජන

යුද මරණ සිහි කිරීම සඳහා උත්සාහ කිරීම හේතුවෙන් යාපනය විශ්ව විද්‍යාලයේ තෝරාගත් ආචාර්යවරුන් කිහිප දෙනෙකුට, ශිෂ්‍ය නායකයින්ට සහ ජනමාධ්‍යවේදීන්ට විවෘත මරණ තර්ජන එල්ල කර ඇත[39]. මැයි 18 වන දා "මව් බිමේ ආරක්ෂාව වෙනුවෙන් කැප වූ සටන්කාමීන්ගේ අවසන් නිවේදනය" යනුවෙන් සඳහන් වූ පොස්ටර් යාපනය විශ්ව විද්‍යාල භූමියේ අලවා තිබුණි. යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ, ශිෂ්‍ය නායකයන්ගේ සහ ජනමාධ්‍යවේදීන්ගේ නම් ද මෙම පොස්ටර්වල ඇතුළත් විය[40].



இறுதி எச்சரிக்கை

யாழ்ப்பாணம் பல்கலைக்கழகமத்தில் பயங்கரவாத்தை வளர்க்க முற்படுவோர்
தண்டிக்கப்படவுள்ளனர்

பயங்கரவாதம் தோற்கடிக்கப்பட்டதன் பின்னர் அவ் பயங்கரவாத்தை யாழ்ப்பாணம்
பல்கலைக்கழகத்தினூடாக வளர்ப்பதற்கு முயற்சி செய்து வருகின்றனர்.

இவ்வாறு முயற்சி செய்யும் தேச விரோத சக்திகளை நாம் இனங்கண்டு உள்ளோம்

இவர்களில் யாழ்ப்பாணம் பல்கலைக்கழக பேராசிரியர்
கள் பீடாதிபதுகள் மாணவர்கள் ஆகியோர் இனங்கானப்பட்டுள்ளதோடு
இவர்களோடு சேர்ந்து ஒருசில பேப்பர் காரர்பளும் செயற்பட்டு வருவதாக எமக்கு
தகவல்கள் கிடைத்துள்ளது

இவர்களிற்கு பலமுறை எச்சரிக்கை கூறியிருந்தும் அவர்கள் திருந்துவதாக
இல்லை தொடர்ந்தும் மாணவர்களோடும் ஆசிரியர்களோடும் சேர்ந்து பயங்கரவாத
நடவடிக்கைகளில் ஈடுபட்டு வருகின்றனர்

இது இவர்களிற்கான இறுதி எச்சரிக்கையாகும்

பீடாதுபதி சிவநாதன்
ஆசிரிய சங்க தலைவர் ராசகுமாரன் மாணவர் ஒன்றிய தலைவர்
கிருபா கோமேஸ் பேப்பர்காரர்களான சாளின் நிரோஜன்
ஆகியோர் உள்பட பலர் இனங்காண பட்டுள்ளனர்

இவர்கள் இனியும் திருந்தா விட்டால் இருதி தீர்பபு மரண தண்டனையே
சிலருக்கு இறுதி நாளும் குறிக்கப்பட்டுவிட்டது

கடந்த எச்சரிக்கைகளை போல் இதனையும் சாதாரணமாக கருதி விட வேண்டாம்

உங்களுக்கு இவ்வுலகில் இருந்து விடுதலை நிச்சயம்

தேசம் காக்கும் படை
18/5/2014

මව්බිමේ ආරක්ෂාව වෙනුවෙන් කැප වූ සටන්කාමීන් විසින් බෙදා හැරි අවසන් නිවේදනය ( ඡායාරූපය Tamil Canadian)

---

[37] http://www.tamilguardian.com/article.asp?articleid=10945 (Last accessed on 10th June 2014)
[38] http://srilankabrief.blogspot.ch/2014/05/why-should-tamils-speaking-of-war-be.html (Last accessed on 10th June 2014)
[39] http://www.tamilguardian.com/article.asp?articleid=10974 (Last accessed on 10th June 2014)
[40] http://www.lankasrinews.com/view.php?224YY5n2202SmBBd4eeoOOldcca0C6AAedddAeMMeaacallOU3e44ZBmm3003c55YO23 (Last accessed on 10th June 2014)

ත්‍රස්තවාදයට සහය දැක්වීම පිළිබඳ චෝදනා කරමින් විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට සහ ශිෂ්‍ය නායකයින්ට මරණ තර්ජන එල්ල කරමින් මැයි 07 වන දා විශ්ව විද්‍යාල භූමියේ අත්පත්‍රිකා ප්‍රදර්ශනය කර තිබුණි.

2014 මැයි 08 වන දින මේජර් ජෙනරාල් උදය පෙරේරා විසින් විශ්ව විද්‍යාල උපකුලපති, පීඨාධිපතිවරු සහ ශිෂ්‍ය නායකයින් ඇතුළු විශ්ව විද්‍යාල පරිපාලනය ප්‍රකාශ කළේ 2014 මැයි 18 වන දින විශ්ව විද්‍යාලය තුළ කිසිදු සිහි කිරීමේ වැඩසටහනකට ඉඩ නොදෙන බවයි. මළ ගිය අය සිහි කිරීමේ උත්සව එල්.ටී.ටී.ඊ නායක ප්‍රභාකරන් වරණනා කිරීමක් සහ ත්‍රස්තවාදයට සහය දීමක් සේ සලකන බව ඉහතෙම තව දුරටත් ප්‍රකාශ කළේය[41].

ශාස්ත්‍රපීඨයේ පීඨාධිපති මහාචාර්ය සිවනාදන් මහතාට එල්.ටී.ටී.ඊ සංවිධානය නැවත පණ ගැන්වීමට කටයුතු කරන බව දක්වමින් නැවත මෙම තර්ජන ඇතුළත් පත්‍රිකා ලබා දී තිබුණි. දේශපාලන පක්ෂයක නියෝගය අනුව සුදුසුකම් නොමැති පුද්ගලයෙක් පරිගණක සහායක තනතුරට බඳවා ගැනීම පිළිබඳ ව කවුන්සිලයේ දී විරුද්ධත්වය ප්‍රකාශ කළ එකම පුද්ගලයා සිවනාදන් මහතාය. මෙය අවකල් ක්‍රියාවක් ලෙස පවසමින් ඔහු කවුන්සිලය විවේචනය කළේය[42].

## 26. යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපතිගෙන් ප්‍රශ්න කිරීම

යාපනය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විසින් 2014 මැයි 20 වන දා සිහි කිරීමේ උත්සවයක් පවත්වනු ලැබීය. මෙම උත්සවය සංවිධානය කිරීමේදී ලබා දුන් දායකත්වය පිළිබඳව යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපති ආචාර්ය රාසකුමරන් මහතාගෙන් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් ප්‍රශ්න කරන ලදී[43].

## 27. වාර්ෂික සිහි කිරීමේ උත්සවය සම්බන්ධයෙන් කතෝලික පූජකවරයෙකුගෙන් හමුදාව ප්‍රශ්න කිරීම

යුද්ධයේ අවසන් දිනයේ දී මිය ගිය කිළිනොච්චියේ උරුතිරපුරම් කතෝලික පල්ලියේ හිටපු භාරකාර පූජකවරයා සහ මිය ගිය සෙසු පුද්ගලයන් වෙනුවෙන් පවත්වන වාර්ෂික සිහි කිරීමේ උත්සවයට දින දෙකකට පෙර එම පල්ලියේ වත්මන් භාරකාර පූජකවරයාගෙන් ආරක්ෂක හමුදා ප්‍රශ්න කරනු ලැබිණි[44]. මෙම සිහිකිරීමේ උත්සවය ආරම්භ වූ 2010 වසරේ සිටම එයට සහභාගී වූ උතුරු පළාතේ ජීවත් වන පූජකවරයෙකු මෙසේ පැවසීය "අසීරුතාවයන් සහ මර්දනයන් හමුවේ වුවද මිය ගිය පූජ්‍ය සරත්ජීවන් පියතුමා සේවය කළ උරුතිරපුරම් පල්ලිය අසල කුඩා ස්මාරකයක් සෑදීමට ප්‍රදේශයේ ජනතාව සමත් වී තිබෙනවා. මෙවර සිහිකිරීමට දින දෙකකට පෙර හමුදා භටයන් කිහිප දෙනෙකු ශාන්ත ෆාතිමා පල්ලියට පැමිණ එහි භාර කාර පූජකතුමාව ප්‍රශ්න කළා. මේ උත්සවයට පිටතින් පුද්ගලයන් පැමිණෙනවා දැයි ඔවුන් විමසා තිබුණා. මේ උත්සවයට පැමිණෙන පිරිස පාලනය කිරීමට 17 වන දා කිලිනොච්චිය සහ උරුතිරපුරම් අතර මාර්ගයේ හමුදා භටයන් විශාල පිරිසක් යොදවා තිබුණා"

---

[41] http://srilankabrief.blogspot.ch/2014/05/why-should-tamils-speaking-of-war-be.html (Last accessed on 10th June 2014)

[42] http://srilankabrief.blogspot.ch/2014/05/why-should-tamils-speaking-of-war-be.html (Last accessed on 10th June 2014)

[43] http://www.sundaytimes.lk/140525/news/juta-president-dr-rasakumaran-decries-tid-questioning-for-organising-commemoration-ceremony-100254.html (Last accessed on 10th June 2014)

[44] http://www.asianews.it/news-en/In-the-north,-Tamils-defy-government-to-remember-Fr-Sara,-who-died-during-the-Civil-War-31197.html (Last accessed on 10th June 2014)